| කායික විද්‍යාත්මක අසාමාන්‍යතා | ලක්ෂණ | පාලනය |
|---|---|---|
| ගෙඩිවල යට කුණු වීම  | ගෙඩියේ යට පැත්ත කුණු වී කළු පැල්ලමක් ඇති වේ. | ක්‍රමානුකූල ජල පාලනය<br>නිර්දේශිත පොහොර භාවිතය<br>පසට කැල්සියම් යෙදීම |
| ගෙඩි පිපිරීම  | ගෙඩි වල වලයාකාර, අරීය හා අක්‍රමවත් පිපිරීම් ඇති වේ | ක්‍රමානුකූල ජල පාලනය<br>පසට කැල්සියම් අඩංගු පොහොර යෙදීම |
| සූර්ය පිළිස්සීම  | ගෙඩි වල සුදු පැහැති පැල්ලම් ඇති වේ | ගෙඩි හිරු එළියට කෙලින්ම නිරාවරණය නොකිරීම |
| ගෙඩි ඇතුළත හිස්වීම  | ගෙඩි ඇතුලත නොපිරුණු ස්වභාවය | නිර්දේශිත පොහොර භාවිතය<br>නියමිත පරතරයට පැළ සිටුවීම |


සැකසුම - රංජනී පීරිස් (පර්යේෂණ නිලධාරිනී)
සඳුනිහිනි ඉන්ද්‍රසේන (විද්‍යාත්මක සහකාර), තේජා විකුම්සිංහ (කෘෂි උපදේශක)
රවීන්ද්‍ර විජයසේන (විෂයමාන නිලධාරී)
උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නෝරුව



Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya
Printed by: AGRICULTURE PRESS, Gannoruwa


අපි වවමු - රට නගමු

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010

# තක්කාලි වගාවේ රෝග




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
2009

| රෝගය | | ලක්ෂණ | පාලනය |
|---|---|---|---|
| දියමලන්කෑම |  | ❍ පැළ ඇද වැටී හෝ මැළ වී පසුව මැරී යාම | ❍ තවාන් ජීවාණුහරනය කර බීජ දැමීම<br>❍ බීජ ප්‍රතිකාරක යෙදීම - දිලීර නාශක (හෝමායි, තිරාම්, කැප්ටාන්) |
| බැක්ටීරියානු හිටු මැරීම |  | ❍ පැළ මැළවීම<br>❍ කඳ කපා වතුරට දැමූ විට කිරි පාට නූල් ආකාර දැකගත හැක | ❍ ප්‍රතිරෝධී වර්ග වගා කිරීම<br>❍ ජලය බැස්සවීම<br>❍ පසට කාබනික පොහොර යෙදීම |
| දිලීර මැළවීම |  | ❍ ගස මැළවීම<br>❍ ගසේ පාමුල හා මුල් කුණුවීම<br>❍ සමහර විට මුල් හා පාමුල කොටසේ සුදු පාට දිලීර දැකගත හැකිවීම | ❍ ජලය හොඳින් බැස යාම සඳහා ගැඹුරු කාණු යෙදීම<br>❍ පැළ වල මුල් හොඳින් තෙමෙන සේ දිලීර නාශක යොදන්න - දිලීර නාශක (හෝමායි, තිරාම්, ටොප්සීන්) |
| අංගමාරය |  | ❍ කොළ හා කඳේ දුඹුරු හෝ කළු පුල්ලි (වැසි ඇති විට ඉක්මනින් පැතිර යයි)<br>❍ ගෙඩි වලට ද පැතිරී යයි | ❍ වැසි සහිත කාලගුණයේදී රෝගය ඉක්මනින් පැතිරී යන නිසා රෝග ලක්ෂණ දුටු වහාම මෙම දිලීර නාශක යෙදිය යුතුයි. එයින් 2 ක් තෝරා මාරුවෙන් මාරුවට සති 2 ට වරක් යොදන්න. (රිඩොමිල්, ඩැකොනිල්, මැන්කොසෙබ්,මැනෙබ්)<br>❍ නිර්දේශිත පොහොර ප්‍රමාණය පමණක් යෙදීම<br>❍ රෝගී ගස් හා ගෙඩි ක්ෂේත්‍රයෙන් ඉවත් කර විනාශ කිරීම |
| පිටිපුස් රෝගය |  | ❍ සුදු පාට පිටි වැනි දිලීර කොටස් කොළවල යට පැත්තේ ඇති වීම<br>❍ කොළ කහ පාට වීම | ❍ සල්ෆර් කුඩු යෙදීම |
| ඇන්ත්‍රැක්නෝස් |  | ❍ ගෙඩි කුණු වීම<br>❍ මල් හැලී යාම<br>❍ කඳ කුණු වීම (වැසි ඇතිවිට රෝගය දරුණු වේ) | ❍ පහත දිලීර නාශක වලින් එකක් ඉසින්න<br>❍ ඩැකොනිල්, මැන්කොසෙබ්, ටොප්සීන්, මැනෙබ්, කාබෙන්ඩසීම් |